මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2022.12.30 |

# කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය 2022 දෙසැම්බර් මාසයේ දී තවදුරටත් පහළ ගියේය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2013=100)[1] වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 61.0හි සිට 2022 වසරේ දෙවන භාගයේ දී පෙන්නුම් කළ පහළම අගය වාර්තා කරමින් දෙසැම්බර් මාසයේ දී සියයට 57.2 දක්වා පහළ ගියේය. එම ප්‍රවණතාවම අනුගමනය කරමින්, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 73.7හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 64.4 දක්වා පහළ ගියේය. මේ අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 53.4හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 54.5 දක්වා පහළ ගියේය.

| උද්ධමනය | 2022 නොවැම්බර් | 2022 දෙසැම්බර් |
|---|---|---|
| **මතුපිට** | | |
| දර්ශක අගය | 242.6 | 243.2 |
| මාසික වෙනස (%) | -0.5 | 0.2 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 61.0 | 57.2 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 42.6 | 46.4 |
| **මූලික** | | |
| දර්ශක අගය | 223.2 | 223.4 |
| මාසික වෙනස (%) | 0.8 | 0.1 |
| වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය (%) | 49.4 | 47.7 |
| වාර්ෂික සාමාන්‍ය උද්ධමනය (%) | 31.4 | 34.6 |

කො.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ විචලනය (ප්‍රතිශත වෙනස)




කො.පා.මි.ද. මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය




කො.පා.මි. දර්ශකයේ මාසික වෙනස, 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 0.26ක් ලෙස වාර්තා විය. මෙයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මාසිකව ඉහළ යෑම වන අතර, එම දායකත්වය සියයට 0.36ක් විය. ඒ අනුව, ආහාර නොවන කාණ්ඩය තුළ, රෙදිපිළි හා පාවහන් (රෙදිපිළි), ප්‍රවාහන (ගුවන් ගමන් ගාස්තු සහ ආදායම් බලපත්‍ර ගාස්තු) සහ නිවාස, විදුලිය, ජලය, ගෑස් හා වෙනත් ඉන්ධන (එල්.පී. ගෑස්) උප කාණ්ඩවල මිල ගණන් ඉහළ ගියේය. කෙසේ වුවද, කො.පා.මි. දර්ශකයේ සමස්ත මාසික ඉහළ යෑම යම් ප්‍රමාණයකට පාලනය කරමින්, 2022 දෙසැම්බර් මාසයේ දී ආහාර කාණ්ඩයේ දායකත්වය සියයට -0.10ක් ලෙස වාර්තා වූ අතර, මේ සඳහා, නැවුම් මත්ස්‍ය, කරවල, ලොකු ළූණු සහ පාන් මිල ගණන්හි පහළ යෑම් හේතු විය.

තවද, වාර්ෂික සාමාන්‍ය උද්ධමනය, 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 42.6හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 46.4 දක්වා ඉහළ ගියේය.

ආර්ථිකයේ යටිදැරි උද්ධමනය පිළිබිඹු කරන වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මූලික උද්ධමනය, 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 49.4හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 47.7දක්වා පහළ ගිය අතර, වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය, 2022 නොවැම්බර් මාසයේ පැවති සියයට 31.4හි සිට 2022 දෙසැම්බර් මාසයේ දී සියයට 34.6 දක්වා ඉහළ ගියේය.

[1] කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100), ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන අතර එමගින් කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික ප්‍රදේශවල කුටුම්බ විසින් මිලදී ගන්නා භාණ්ඩ හා සේවාවල මිලෙහි සාමාන්‍ය වෙනස්වීම් පෙන්නුම් කරනු ලබයි.

### උප කාණ්ඩ අනුව කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය
### (වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)




## කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (2013=100) හැසිරීම

| කාලපරිච්ඡේදය | | දර්ශක අගය | | මාසික % වෙනස | | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | වාර්ෂික සාමාන්‍ය % වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|
| වසර | මාසය | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) | කො.පා.මි.ද. | කො.පා.මි.ද. (මූලික) |
| 2021 | දෙසැම්බර් | 154.7 | 151.3 | 2.7 | 1.3 | 12.1 | 8.3 | 6.0 | 4.4 |
| 2022 | ජනවාරි | 158.4 | 154.1 | 2.4 | 1.9 | 14.2 | 9.9 | 6.9 | 5.0 |
| | පෙබරවාරි | 160.1 | 155.7 | 1.1 | 1.0 | 15.1 | 10.9 | 7.9 | 5.7 |
| | මාර්තු | 164.9 | 159.4 | 3.0 | 2.4 | 18.7 | 13.0 | 9.1 | 6.5 |
| | අප්‍රේල් | 180.2 | 172.4 | 9.3 | 8.2 | 29.8 | 22.0 | 11.3 | 8.1 |
| | මැයි | 195.2 | 182.9 | 8.3 | 6.1 | 39.1 | 28.4 | 14.2 | 10.2 |
| | ජූනි | 220.2 | 200.2 | 12.8 | 9.5 | 54.6 | 39.9 | 18.4 | 13.3 |
| | ජූලි | 230.1 | 208.0 | 4.5 | 3.9 | 60.8 | 44.3 | 23.1 | 16.7 |
| | අගෝස්තු | 235.8 | 212.0 | 2.5 | 1.9 | 64.3 | 46.6 | 28.0 | 20.3 |
| | සැප්තැම්බර් | 244.7 | 219.3 | 3.8 | 3.4 | 69.8 | 50.2 | 33.4 | 24.1 |
| | ඔක්තෝබර් | 243.8 | 221.4 | -0.4 | 1.0 | 66.0 | 49.7 | 38.3 | 27.8 |
| | නොවැම්බර් | 242.6 | 223.2 | -0.5 | 0.8 | 61.0 | 49.4 | 42.6 | 31.4 |
| | දෙසැම්බර් | 243.2 | 223.4 | 0.2 | 0.1 | 57.2 | 47.7 | 46.4 | 34.6 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව